සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்தியமாகாணகல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස(උ/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

| පෙරදිග සංගීතය I | 54 | S | I | 13 ශ්‍රේණිය | පැය දෙකයි |
|---|---|---|---|---|---|

**උපදෙස්:**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතු ය.
- ප්‍රශ්න අංක 01 සිට 50 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

01. ශාස්ත්‍රීය වාද්‍ය ඛණ්ඩයක් ඉදිරිපත් කිරීමේදී සංගීත භාණ්ඩයේ අනුනාද තත් සුසර කර තිබීම ඉතා වැදගත්ය. මෙම කියමන අදාළ නොවන සංගීත භාණ්ඩය වන්නේ

1. සිතාරය 2. එස්රාජය 3. සරෝද් 4. තාම්පුරාව 5. දිල්රුබාව (........)

02. ඛ්‍යාල් ගායනයේදී ගීතයේ වචන යොදා ගනිමින් ගායනා කරන තාන වර්ගය කුමක්ද?

1. ශුද්ධතාන 2. බෝල්තාන 3. කූට තාන 4. මිශ්‍රතාන 5. සපටතාන (........)

03. නිර්දේශිත රාග අතුරින් පරමේල ප්‍රවේශක රාගයක් හා පංචමය විවාදි ස්වරයක් ලෙස භාවිතා කරන රාගය පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.

1. ජයජයවන්ති හා දේස්
2. භාගේශ්‍රී හා ජයජයවන්ති
3. හංසධ්වනි හා ජයජයවන්ති
4. දේශ් හා භාගේශ්‍රී
5. ජයජයවන්ති හා භාගේශ්‍රී (........)

04. පහත දැක්වෙන රාග යුගල අතරින් පූර්වාංගවාදි රාග යුගලය තෝරන්න.

1. ආසාවරි හා ජයජයවන්ති
2. තිලක්කාමොද් හා ආසාවරි
3. ආසාවරි හා භෛරව
4. භාගේශ්‍රී හා ජයජයවන්ති
5. කාලිංගඩා හා ජයජයවන්ති (........)

05. රිමප, නිධප, පධපම, ගරිගස, යන ස්වර සංගතිය අයත් රාගය

1. දේස් 2. ජයජයවන්ති 3. භාගේශ්‍රී 4. හංසධ්වනි 5. ආසාවරි (........)

06. ආසාවරි රාගයේ මේල ස්වර වන්නේ

1. ස රි ග ම ප ධ නි
2. ස රි ග ම ප ධ නි
3. ස රි ග ම ප ධ නි
4. ස රි ග ම ප ධ නි
5. ස රි ග ම' ප ධ නි (........)

07. රාග දෙකක වෙනස හඳුනා ගැනීමට වඩාත්ම ප්‍රයෝජනවත් වන්නේ,

1. රාග සංගතින්ය
2. මේලයන්ය
3. රාග ජාතින්ය
4. ගායනසමයය
5. වාදි සංවාදි ස්වරය (........)

08. කර්ණාටක සංගීතයේ ශුද්ධ මේලය ලෙස සලකනු ලබන්නේ

1. හරිකාම්බෝජි
2. නට භෛරවි
3. කරහරප්‍රිය
4. මායාමාලව ගෞල
5. ධීර ශංකරා භරනම් (........)

09. මින්ඩ භාවිතයෙන් ගැයීම සඳහා වඩාත් උචිත නොවන ස්වර සංගතිය තෝරන්න.

1. සප 2. පරි 3. පස 4. සස 5.නිප (........)

10. "මුව මුක්තාලතා" හා "හෝපලු වන පෙත" යන ගීත දෙකෙහි නාද මාලා සඳහා පදනම් වූ රාග දෙක පිළිවෙළින්

1. භාගේශ්‍රී හා පිළු 2. මාලකෞන්ස් හා පිළු 3. පිළු හා භාගේශ්‍රී
4. ශිවරංජනී හා පිළු 5. භෛරව හා පිළු (........)

11. ක්‍රි.ව. 1719 දී මොහොමද් ෂා රංගිලේ නැමැති මෝගල් අධිරාජ්‍යයා විසින් සදාරංග හා අදාරංග යන දෙදෙනා ලවා ගීත දහස් ගණනක් රචනා කරවන ලදී. එම ගීත ශෛලිය වනුයේ.

1. ගසල් 2. ඛයාල් 3.ධ්‍රැපද් 4. ධමාර් 5. තරාණා (........)

12. පහත සඳහන් කරුණු අතුරෙන් ගායන සමය සම්බන්ධයෙන් මධ්‍යම ස්වරය පිළිබඳ නිවැරදි කියමන කුමක්ද?

1. උදය සන්ධි ප්‍රකාශ රාගයන්ගේ මධ්‍යමය ශුද්ධ වේ.
2. සන්ධ්‍යා සන්ධි ප්‍රකාශ රාගයන්ගේ මධ්‍යමය තිව්‍ර වේ.
3. සන්ධි ප්‍රකාශ රාග ගායන සමය තීරණයට මධ්‍යම ස්වරය හේතුවේ.
4. මධ්‍යම ස්වරය අද්ව දර්ශක ස්වරය ලෙස හැඳින්වේ.
5. සන්ධි ප්‍රකාශ රාගයක් ලෙස තීරණය කිරීම සඳහා මධ්‍යම ස්වරය පමණක් සැලකීම ප්‍රමාණවත් වේ. (........)

13. තිලවඩා හා ත්‍රිතාලය අයත් මාත්‍රා සංඛ්‍යාව පිළිවෙළින් දක්වා ඇත්තේ

1. 15-16 2. 16-12 3. 16-16 4. 14-16 5. 12-16 (........)

14. උත්තර භාරතීය ප්‍රකට සන්තූර් වාදන ශිල්පියෙකි.

1. පන්ඩිත් රාමා නාරායන් 2. උස්තාද් රන්බීර් සිං 3. පණ්ඩිත් ශිව කුමාර් ශර්මා
4. අයිෂ් චන්ද්‍ර බෙනර්ජි 5. පණ්ඩිත් බිම්සෙන් ජෝෂි (........)

15. භාවික ගීත, ශිෂ්ට ගීත, වැනි ග්‍රන්ථ රැසක් පාසැල් සංගීත අධ්‍යාපනයට එකතු කළ සංගීතඥයා වන්නේ.

1.ඇම්.ජී.පෙරේරා 2.විශාරද ප්‍රේමවංශ හපුවලාන
3.බී.එස්.විජේරත්න 4. ආනන්ද ජයසිංහ
5. වින්සන්ට් සෝමපාල (........)

අංක 16 සිට 18 දක්වා ප්‍රශ්න වලට පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න

| A | B | C | D |
|---|---|---|---|
| මැන්ඩලින | ට්‍රම්පට | ග්ලොක්කැන්ස්පිල් | සැක්සෆෝන් |

16. A B C D සංගීත භාණ්ඩ බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව පෙලගස්වනුයේ මෙසේය

| | | | |
|---|---|---|---|
| 1. Brass | Wood wind | Percussion | String |
| 2. String | Brass | Percussion | Wood wind |
| 3. Wood wind | Perchssion | String | Brass |
| 4. Percussion | Wood wind | Brass | String |
| 5. String | Wood wind | Percussion | Brass |

(........)

17. පාසැල් අපරදිග තූර්ය වාදක කණ්ඩායමක් තුළ දක්නට නොලැබෙන භාණ්ඩ දෙකක් වනුයේ

1.A හා B ය 2.A හා C ය 3.B හා D ය 4.Cහා D ය 5.B හා C ය. (........)

18. Single reed භාණ්ඩය වනුයේ

1A ය 2.B ය 3.C ය 4. D ය 5.B හා Dය (........)

19. ව්‍යවහාරික සංගීත ප්‍රස්තාරකරණයේදි කිසියම් ප්‍රස්තාරයක අතර මගදි මුලින් තිබූ ස්වර ප්‍රස්තාර කොටස් ඒ ආකාරයෙන්ම නැවත වාදනය කිරිමට අවශ්‍ය වූ විට ඒ තැන්වල යොදනු ලබන සංකේතය.

1. ff 2. pp 3. //: :// 4. # 5.𝄋 (........)

20. සරල ගීතයක් නිර්මාණයේදි බොහෝ විට ගීතයේ පදමාලාව ගැයෙන ප්‍රධාන තනුව මතම ඊට ගැලපෙන අයුරින් වෙනත් නාදමාලාවක් වාදනය කරනු අසන්නට ලැබෙ. මෙම කොටස හඳුන්වනු ලබන්නේ,

1. Interlude ලෙසය 2. Introduction ලෙසය 3.Chords ලෙසය
4. Counterpoint ලෙසය 5. Scale ලෙසය (........)

21. “සැදැ කළුවර කුර ගගා විත් ” මෙම සරල ගීතය නිර්මාණයට පදනම් වූ ගීත විශේෂය වනුයේ,

1. අස්නෙ ගායනා 2. නෙළුම් ගී 3. වන්නම්
4. ගොයම් ගී 5. මංගලම් ගී (........)

22. උඩරට, පහතරට, සබරගමු ,සම්ප්‍රධායන්ට ආවේණික ශාන්ති කර්ම පිළිවෙළින් සඳහන් වරණය වනුයේ

1. කොහොඹ කංකාරිය, පහන් මඩු, දෙවොල් මඩු
2. කොහොඹ කංකාරිය, දෙවොල් මඩු , පහන් මඩු
3. බලි ශාන්ති කර්මය, පූනා මඩු ,වලියක් මංගල්‍යය
4. වලියක් මංගල්‍යය, කිරි මඩු ,දෙවොල් මඩු
5. ගම් මඩු, කඩවර කංකාරිය, පූනා මඩු (........)

23. ප්‍රශස්ති හා නූර්ති ගීත හා බැදුණු සුවිශේෂි ලක්ෂණයක් පිළිවෙළින් යෙදුනු වරණය වනුයේ.

1. අඩව්ව, දොහොරාව 2. දොහොරාව, ඉන්නිසය 3. මුද්‍රප්පදය, දොහොරාව
4. ඉරට්ටිය, මුද්‍රප්පදය 5. මුද්‍රප්පදය, තෝඩායම (........)

24. පහත දැක්වෙන ගී පාද අතුරෙන් ගැමි සමාජයේ සාමූහික බව දනවන ගීත පාද තෝරන්න.

A නාන විලේ නා ගස් නවයක් තිබුණා
B කරුවල තොටේ මම බැසලා නානකොට
C රත්තරං පනේ නුඹ එවූ පත දුටුවා
D උදයට පායන හිරු දෙවියන්ටයි
E බැද්ද වටට සුදු මොරමල් පිපිලා

1. A හා C 2.A හා D 3.B හා D 4.C හා E 5. A හා E (........)

25.කණ්ඩායම් සංගීතය සහිත සිංහල ගීතයක් ගැයූ ප්‍රථම සංගීත කණ්ඩායම

1. මී මැස්සෝ 2. ධර්මරත්න බ්‍රදර්ස් 3. මූන්ස්ටෝන්
4. ගෝල්ඩන් චයිමස් 5. ලොස් කැබලෙරෝස් (........)

26. ධර්මදාස වල්පොල ගයනු ලබන සම්ප්‍රධායික කවි නාද රටා අනුව නිර්මාණය වී ඇති චිත්‍රපට ගීතය
1. කමලාසනී 2. මගේය ප්‍රේම මාලිනී 3. කටේ කිරි සුවඳ
4. කුඩා ගමේ මද්දහනේ 5. පිපී පිපී රේණු නටන

27. බටහිර සංගීතඥ ලුඩ්විග් වැන් බිතෝවන් විසින් නිර්මාණය කරන ලද සංධවනියක් වන්නේ
1. ප්‍රාග් . 2. එරොයිකා 3. ජුපිටර් 4. ට්‍රිබියුට 5. G.මේජර් (........)

28. නාඩගම් හා නුර්ති ශෛලීන් පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුලත් වරණය.
1.ස්ථායි අන්තරා ගීත ආකෘතිය ගීත වර්ග දෙකේම යෙදේ.
2. තෙරුක්කුත්තු වීදි නාට්‍ය ආභාෂයෙන් ගීත වර්ග දෙකම ගොඩ නැගී ඇත.
3. ප්‍රථම නුර්තිය දිව්‍ය කුසුම වූ අතර ප්‍රථම නාඩගම වෙස්සන්තර වේ.
4. නාඩගම් සඳහා ගමන් තාලද නුර්ති ගීත ගායනය තානමකින් ඇරඹේ
5. නුර්ති සඳහා හින්දුස්ථානි සංගීතයත් නාඩගම් සඳහා කර්ණාටක සංගීත අභාෂයත් ලබා ඇත. (........)

29. චතුරංග නම් ගායන ශෛලියේ අඩංගු නොවන කොටසකි.
1.තරාණා 2.තිර්වට 3. ගසල් 4. සර්ගම් 5. ඛ්‍යාල් (........)

30. ගීතයක් ගායනය කර එය පරිගණකය තුළ පටිගත කළ හැකි මෘදුකාංගයක් තෝරන්න.
1. Indesign 2.Pageinaker 3.Adobe oudition 4. Word 5.Excel (........)

- 31 සිට 50 දක්වා ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

31. ...................... රාගයට අනුව ගොඩ නැගෙන ගගරිස පපගපගගරිස යන ස්වර අභ්‍යාසයේ ඊළඟ ස්වර බණ්ඩය වනුයේ ..................................

32. "වාසනා දිනේකි මෙක පාමු තුටින්" නැමැති නුර්ති ගීතයේ තනුව පිළිවෙළින් ........................තාලය හා ..............................අනුව නිර්මාණය වීඇත.

33. නිර්දේශිත රාග අතරින් මේලය, වාදි, සංවාදි, ගායන සමය යන කරුණු සියල්ලම සමානව යෙදෙන රාග දෙක වන්නේ ......................................රාගය හා ...................................රාගයයි.

34. ගරිමස මගපරි වශයෙන් ආරෝහණය පිළිවෙළින් යෙදෙන ස්වර අභ්‍යාස රටාවේ ඊළඟ පියවරට අයත් ස්වර හතර පිළිවෙළින් ...........................................වන අතර ඒහි අවරෝහණ රූපයට අනුව යෙදෙන ප්‍රථම පියවරෙහි ස්වර හතර පිළිවෙළින් ..........................................වේ.

ප්‍රශ්න අංක 35 සිට 39 තෙක් ප්‍රශ්ණ වලට පහත වගුව ඇසුරු කර ගනිමින් පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A තබලාව | 1. කිට දිත්තං |
| B ඒක්තාලය | 2. තිට තාS |
| C ධමාර් | 3. ධා ධා ධිං ධිං |
| D තිලවඩා | 4. තිරිකිට |
| E මද්දලය | 5. කත්තා |

35. ..........................................තාලයට අයත් සිව්වන විභාගයේ අවනද්ධාක්ෂර වනුයේ ..........................ය.

36. ...............................භාණ්ඩයෙන් නිකුත් වන පදයකි රත්තං .......................................

37. ...............................තාලයෙහි දෙවරක්ම යොදා ගැනෙන පද බණ්ඩය ............................................වේ.

38. මෙහි සඳහන් පඛාවාජයෙන් වැයෙන තාලය .......................................වන අතර ඒහි අවසාන විභාගයේ යෙදෙන අවනද්ධාක්ෂර ...........................................වේ.

39. රාගධාරි විලම්භලය ගත් වාදනයක් සඳහා වාදනයට සුදුසු ඉහත සඳහන් .තාලය ..................................වන අතර එම තාලය වයනු ලබන්නේ ...........................................වෙනි.

40. චතුර් වේදය අතුරෙන් සංගීතය හා සම්බන්ධ වේදය ........................................................ලෙස හඳුන්වන අතර මුලික වෛදික ස්වර තුන උදාත්ත.............................................ස්වරිත ලෙස හැඳින්වේ.

41. බටහිර සංගීතයට අනුව Soprano ....................................... Tenor ...............................වශයෙන් මුලික හඬ තල හතරක් ඇත.

42. සබෙ විදානේ ,ආරච්චිල ,වැනි චරිත ඇතුළත් රංග සම්ප්‍රදාය ....................................නමින් හැඳින්වෙන අතර එය රඟ දක්වනු ලැබුවේ...................................................................ය.

43 "පුරණ සමුදුර දුවන නැව් දැකලා" යන හටන් ගීතය ...............................තිතට අනුව ගයන අතර හටන් ගීත මහනුවර යුගයේදි ..........................................................විසින් ගයා ඇත.

\

44. සැවුලා වන්නම .......................................සම්ප්‍රදායට අයත් වන අතර එය ...................................තිත අනුව ගයනු ලබයි.

45. CFA යන ස්වර .........................කෝඩ් එක නියෝජනය කරන අතර CF#A යෙදෙන කෝඩ් එක .................. නමින් හැඳින්වේ.

46. මධ්‍ය ෂඩ්ජයේ සංඛ්‍යාතය 256 $H_z$ වන විට පංචමයේ සංඛ්‍යාතය ..........................වන අතර නිශාදයේ සංඛ්‍යාතය ......................................................වේ.

47. ම<u>ග</u> මගුස <u>නි</u>සධ<u>ු</u> <u>නි</u> සම ස්වර ඛණ්ඩය....................................රාගයට අයත් වන අතර එම රාගය ආශ්‍රිතව නිර්මාණය වු රාගාශ්‍රිත සරල ගීතයක් ලෙස ......................................ගීතය හැඳින්විය හැක.

48. "බඹරු ඇවිත්" චිත්‍රපටියේ ............................................ගීතය ස්ථායි අන්තරා ආකෘතියෙන් තොරව නිර්මාණය වු ගීතයක් වන අතර එය ගායන කළේ ......................................විසිනි

49. දක්ෂ ගසල් ගායකයකු වන ..........................................විසින් "Chandi Jarsa Ranga" නම් ගීතය ............... චිත්‍රපටිය සඳහා ගයා ඇත.

50. පන්ඩිත් පන්නලාල් ඝෝෂ් ....................................... සංගිත භාණ්ඩයටද බි.වික්ටර් පෙරේරා ...................... සංගිත භාණ්ඩයටද ප්‍රවීණත්වය දරා ඇත.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස(උ/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

| පෙරදිග සංගීතය II | 54 | S | II | 13 ශ්‍රේණිය |
|---|---|---|---|---|

| පැය තුනයි | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 |
|---|---|

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:-

- I කොටසින් ප්‍රශ්න දෙකකටද II කොටසින් එක් ප්‍රශ්නයකටද III කොටසින් ප්‍රශ්න දෙකකටද වශයෙන් සියළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න (සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ)

## I කොටස

01. පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග හතරකට අයත් ස්වර සංගති කිහිපයකි.

A - ගප නිප ගරි රිගපරිස

B –රිම පධ මග රිගස

C –රිගමප මග රිගරිස

D - මගු මධනිුධ මගුරිස

i. ඉහත රාග හතර හඳුනාගෙන අදාල ඉංග්‍රීසි අක්ෂරයද සමගින් පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. ඉහත රාග අතුරෙන් ඛමාජ් මේලගත රාගයක මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර මාත්‍රා 8 කට නොඅඩු තානාලංකාර දෙකක් ලියන්න. (ලකුණු 08 යි)

iii. A රාගයට අදාළ රාගාශ්‍රිත ස්වර අභ්‍යාසයක් උච්ච සප්තය දක්වා ගොඩ නගන්න. (ලකුණු 04 යි)

iv. ඉහත B හි දැක්වෙන රාගයට අයත් සමප්‍රකෘති රාගය නම් කර එම රාග දෙකෙහි සමානතා දෙකක් හා අසමානතා දෙකක් ලියන්න. (ලකුණු 04 යි)

02. පාසල පදනම් කර ගත් ඇගයීමකදී සිසුවෙක් ආසාවරි රාගයට අදාළ මධ්‍යලය ගීතයක් ඉදිරිපත් කළේය. ඔහුට නොදැනිම ආසාවරි රාගයේ සමප්‍රකෘති රාගය හා සම්බන්ධ අංග ද ඔහුගෙන් ගැයුනි. මේ පිළිබඳ ඔහුට උපදෙස් ලබා දෙන්න

i. එම සමප්‍රකෘති රාගය කුමක්ද? (ලකුණු 02 යි)

ii. එම රාග දෙකෙහි වෙනස ස්වර ඛණ්ඩ දෙකක් මගින් දක්වන්න. (ලකුණු 04 යි)

iii. එම රාග දෙකෙහි සමානතා හා අසමානතා දෙක බැගින් දක්වන්න. (ලකුණු 04 යි)

iv. නැවත ඔබ ඔහුට ගායනා කර පෙන්වන ආසාවරි රාගයේ මධ්‍යලය ගීතයේ ස්වර ප්‍රස්තාරය ස්ථායි අන්තරා වශයෙන් ප්‍රස්තාර කරන්න. (ලකුණු 06යි)

v. ආසාවරි රාගයට අදාලව ස්වර විස්තාරයක් (ආලාප) ස්වර 25 නොඅඩු වනසේ ගොඩ නගන්න. (ලකුණු 04 යි)

03. පහත දැක්වෙනුයේ නිර්දේශිත තාල කිහිපයකට අයත් තොරතුරු වගුවකි.

I. මෙම වගුවේ A,B,C,D,E,F,G,H,I,J යන හිස්තැන් සම්පූර්ණ කරන්න.

| අවනද්ධ අක්ෂර | තාලය | මාත්‍රාගණන | තාල සංකේත පිළිවෙල | වාදන භාණ්ඩය |
|---|---|---|---|---|
| ධි ධි නා | ----A--- | 10 | ---- B -- | තබ්ලාව |
| ධාතිං තිං තා | C -------- | D -------- | X 2 0 3 | E -------- |
| ධාගේ තිරිකිට | F -------- | G -------- | H -------- | තබ්ලාව |
| ගධි ගින | I -------- | 12 | X 0 2 0 3 4 | ---J---- |

(ලකුණු 05 යි)

(ii) ඉහත I තාලය භාවිතා කරන ගායන ශෛලිය නම් කර එම ගායන ශෛලියට අදාළ වන සුවිශේෂි කරුණු පහක් ලියන්න. (ලකුණු 06 යි)

(iii) F තාලය තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න (ලකුණු 04 යි)

(IV) F හා I තාල දෙකෙ සමානතා 2 හා අසමානතා 3 ක් ලියන්න. (ලකුණු 05 යි)

## II කොටස

04.

i. ගැමි ගී හා සේ ගී පහත කරුණු යටතේ සන්සන්දනය කරන්න. (ලකුණු 08 යි)
* ස්වර පරාසය
* බස්වහර
* තාලය
* නිර්මාණකරුවන්

ii. අනාසාතාත්මක ගැමි ගී වර්ග 4 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

iii. "ගැමි ගිය නිර්ව්‍යාජ කලා මාධ්‍යයකි" ගැමි ගී වර්ග දෙකක් තෝරාගෙන එම ගීතවල යෙදෙන පදමාලාව ඇසුරින් මෙම කියමන සනාථ කරන්න. (ලකුණු 08 යි)

05.

i. කෝළම් හා සොකරි රංග ශෛලීන් හි සංගීතමය ලක්ෂණ පහත සඳහන් ශීර්ෂ යටතේ ගොනු කරන්න.
- ගී තනු සඳහා ලැබුණු අභාෂය
- වාද්‍ය භාණ්ඩ
- ගී තනුවල ස්වර පරාසය
- ආසනාත්මක හා අනාසාතාත්මක ගායනා (ලකුණු 08 යි)

ii. නූර්ති රංග සම්ප්‍රදායේ සංගීතමය ලක්ෂණ පහක් ලියන්න. (ලකුණු 05 යි)

iii. රාගාශ්‍රිත නූර්ති ගීත 3 ක් ආශ්‍රිත රාගය සමඟ ලියා දක්වන්න. (ලකුණු 03 යි)

iv. නාඩගම් රංග ශෛලිය සඳහා කර්ණාටක සංගීතයේ අභාසය ලැබී ඇති ආකාරය කරුණු හතරක් යටතේ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

## III කොටස

06.





i. ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි)

ii. a) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය අයත් ස්කේලය නම් කරන්න. (ලකුණු 01 යි)

b) එම ස්කේලයට අයත් ස්වර පිළිවෙලින් ලියන්න. (ලකුණු 02 යි)

iii. පහත සඳහන් පාරිභාෂික වචන අතුරෙන් 3 ක් තෝරා ගෙන නිදසුන් දක්වමින් විස්තර කරන්න.

(a) ලෙගාටෝ (b) ස්ලර් (c) පිසිකාටෝ (d)ඩික්‍රෙසෙන්ඩෝ (e) ස්ටෙකාටෝ (ලකුණු 09 යි)

07.

i. උතුරු ඉංදිය සංගීතයෙහි විකාශය වූ යුග 4 ක් නම කරන්න. සාරංගදේව තාන්සෙන් අමීර්කුෂ්රු සහ භාත්ඛණ්ඩෙ පඩිවරුන් කිනම යුගවලට අයත් දැයි වෙන් වෙන්ව සඳහන් කරන්න. (ලකුණු 04 යි)

ii. පහත සඳහන් කරුණු 4 කට ඉහත සංගීතඥයෙකු තෝරා ගන්න. එම කරුණු සනාථ වන සේ ඔහුගෙන් සංගීතයට සිදුවූ සේවාව විස්තර කරන්න.

* ග්‍රන්ථකරණය * ගායන ශෛලින් *සංගීත අධ්‍යාපන ආයතනය (ලකුණු08 යි)

* සංගීත භාණ්ඩ * ශාස්ත්‍රිය කරුණු විදිමත් කිරිම

iii. අදාරංග සදාරංග විසින් ප්‍රචලිත කළ ගායන ශෛලිය කරුණු හතරක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 04 යි)

iv. පහත සඳහන් ගී පාදය සුදුසු තනුවක් නිර්මාණය කර ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

"මවගේ තුරුලේ සිහිනි බිළිඳුන්
නහන හසරැලි සිත පිනායයි." (ලකුණු 04 යි)

08.

i. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක් තෝරා ගෙන උදාහරණ සහිතව විස්තර කරන්න.

a) හටන් ප්‍රශස්ති සම විෂමතා

b) කණ හා ස්වරාලය සංගීතයේදී වැදගත් වන අයුරු

c) සංධ්වනි

b) බිතෝවන් (ලකුණු 06 යි)

ii. පහත සංගීත භාණ්ඩ අතුරෙන් එක් සංගීත භාණ්ඩයක දළ රූප සටහනක් ඇඳ කොටස් හයක් නම් කරන්න. (ලකුණු 06 යි)

1.ගිටාරය 2. එස්රාජය 3. වයලීනය 4.තබලාව

iii. සිංහල බසින් රචිත ඔබ කැමති ඕනෑම සරල ශාස්ත්‍රීය ගීතයක් තෝරා ගෙන එහි දැක්වෙන ශාස්ත්‍රීය ලක්ෂණ 4 ක් සැකවින් විස්තර කරන්න (ලකුණු 04 යි)

IV. තබලා වාදනයක ඇතුළත් කායදා පල්ටා කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04 යි)